සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

## පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

# "අදිති"

7

පැය 01 යි මිනි 15

විභාග අංකය ...............................

### විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

(01) ටිකෙන් ටික අඳුර වැඩි වේගෙන එයි. ගස් මුදුන්වල මිහිරි හඬින් ගායනා කරමින් සිටි කුරුල්ලෝ ලැගුම් පොළවල් සොයා යති. කැලෑවේ එක් පැත්තක සිට අනෙක් පැත්තට දුවන්නට එළියට පැමිණි හාවෙක් කන් දෙක උඩ හිඳුවා ගෙන වහා ගමන් ගත් කුමාරයන් දෙදෙනා දෙස බලා සිටියි. කුමාරයන් දෙදෙනා බලන්නටත් පෙර <u>හාවා ආපසු කැලයට පැන දුවයි.</u>

i. ටිකෙන් ටික වැඩි වන්නේ කුමක් ද? ........................................................................................................

ii. ගස් මුදුන්වල සිටියේ කවුරුන් ද? ...............................................................................................................

iii. කුරුල්ලන් රාත්‍රිය ගත කරන ස්ථානය මෙහි හඳුන්වා ඇත්තේ කෙසේ ද? ...........................................

iv. කුරුල්ලෝ ගීත ගායනා කළේ කෙසේ ද? ....................................................................................................

v. මෙහි සඳහන් බහුවචන අනුක්ත පදයක් තෝරා ලියන්න. ..........................................................................

vi. ඡේදයේ ඉරි ඇඳි වාක්‍ය බහුවචනයට හරවා ලියන්න. ...............................................................................

(02) පහත පදවලට ගැළපෙන විරුද්ධ පද ලියන්න.

i. ආරම්භය - ...............................................................

ii. යහපත් - ..............................................................

(03) අතීත කාල ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

i. අම්මා ද තාත්තා ද පොළට ................................ (ගියහ, ගියේ ය)

ii. මල්ලී සමඟ මම සෙල්ලම් .................................. (කරමි, කළෙමු)

(04) දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

i. භාවිත / සුදු / කරන්න / පාර / වනවිට / ඉර / මාරු

...................................................................................................

(05) කොටුව තුළ ඇති වචනවලින් 'ඍ' ශබ්දය යෙදුණු වචනය තෝරා ලියන්න.

i. | කෘතිය / තෘණ / නෛතික / ඖෂධ | ..............................................

ii. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

අදාල, හණික, අග්ගලා

(06) පහත වැකිවල සුදුසු විරාම ලකුණු යොදන්න.

i. මේ ඔයාලගේ පොත් ගුල මුල් ගුරුතුමා කීවේ ය

ii. හරි අපූරු කතාවක් නේ මට කියැවුණේ ඉබේට ම ය.

(07) ඉරි ඇඳි අකුරට යෙදී ඇති පිල්ලම් නම් කරන්න.

i. පෞරාණික - ..................................................

ii. ප්‍රාදේශීය - ..................................................

(08) පහත වැකි ලේඛන වහරට හරවා ලියන්න.

i. ඔටුවා කාන්තාරයේ ගමන් කරනවා.

..........................................................................................

ii. ගංගා පහළට ගලා බසිනවා.

..........................................................................................

(09) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

i. ආඬි හත්දෙනාගේ ............................................. වගේ.


ii. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ ............................................. වගේ.

(10) එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

i. Mouth - ..................................................

ii. Vegetables - ..................................................

(11) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ලියන්න.

i.  ..................................................

ii.  ..................................................

(12) පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

i. has / She / a /frock / beautiful

..........................................................................................

ii. are / We / going / the / temple / to

..........................................................................................


(13) පහත සඳහන් දෙමළ වචන සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

i. පත්තු මණි - ................................................

ii. පුහෙයිරද නිලෛයම් - ................................................

(14) 63249 හි සංඛ්‍යා නාමය ලියන්න. ...................................................................

(15) වෘත්තය තුළ ඇති ඉලක්කම් 4 ම යොදාගෙන සෑදිය හැකි කුඩාම සංඛ්‍යාව ලියන්න.





.....................................................

(16) දී ඇති රෝම සංඛ්‍යාවේ පෙර හා පසු සංඛ්‍යා ලියන්න.

i. ......................... xiv .............................

(17) A හා B හිස්තැන්වලට පිළිවෙලින් ගැළපෙන පිළිතුර ලියන්න.




A - ...............................

B - ...............................

(18) පහත බර මැනීමට භාවිතා කළ හැකි අවම තරාදි පඩි ගණන ලියන්න.


i. 370g - ..........................................

ii. 980g - ..........................................

(19) භාජනයක් සම්පූර්ණයෙන් ම පිරවීමට වතුර $10l$ ක් අවශ්‍ය වේ. ඉන් $\frac{1}{4}$ ක් ඉවත් කර නැවත එම භාජනයට $500ml$ ක් එකතු කළ විට භාජනයේ ඇති මුළු ජල ප්‍රමාණය මිලි ලීටර්වලින් ලියන්න. ..........................................................

(20) 705cm මීටර් හා සෙන්ටිමීටර්වලින් ලියා දක්වන්න. .......................................

(21) බොත්තම් ගොඩකින් $\frac{1}{3}$ කට බොත්තම් 62ක් නම් බොත්තම් ගොඩේ ඇති මුළු බොත්තම් ගණන කීය ද? .........................................

(22) 

මෙම පතොරමින් සෑදිය හැකි ඝන වස්තුව නම් කර එහි ඇති මුහුණත් ගණන ලියන්න.

.........................................................

(23) පහත දැක්වෙන්නේ දුර නගර කිහිපයක දුර දැක්වෙන සටහනකි.

| | | | | E |
|---|---|---|---|---|
| | | | D | 60 |
| | | C | 72 | 132 |
| | B | 50 | 122 | 182 |
| A | 35 | 85 | 157 | ...... |

A සිට E නගරයට ඇති දුර සොයන්න.

............................................


(24) පහත දැක්වෙන භාග සංඛ්‍යාව දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

$\frac{1}{2}$ ..........................................................

(25) උදාරා වාහනයක් මිලදී ගන්නා ලදී. ඇය සතුව රු.33,060.00 ක් තිබූ අතර, ඇය බැංකු ණයක් ලෙස රු.35,873.00 ලබා ගන්නා ලදී. එම සියල්ල වාහනය මිල දී ගැනීමට යෙදවූයේ නම් වාහනයේ මිල රුපියල් කීය ද? ..............................................................

(26) නෙලුම් මල් 515 ක් වට්ටි පහකට සමාන ව දමන ලදී. එක වට්ටියකට දමන ලද නෙලුම් මල් ගණන සොයන්න. ......................................................................

(27) පහත රූපයේ තවත් $\frac{1}{4}$ ක් පාට කරන්න.



(28) අහස්නා ගමනක් යාම සඳහා නිවසින් පිටත් ව පාපැදියෙන් 4km 200m ක් ද, ඉන්පසුව 40km 750m ක් බසයෙන් ද ගමන් කළා ය. ඇය පා පැදියෙන් ගමන් කළ දුරට වඩා කොපමණ දුරක් බසයෙන් ගමන් කර තිබේ ද? ..............................................................

(29) නදී යම් ස්ථානයක සිට මීටර් 3 ක් උතුරු දිශාවට ගමන් කර ඇයගේ දකුණු අත පැත්තට හැරී තවත් මීටර් 2 ක් ගමන් කළා ය. ඒ අනුව ගමන ආරම්භ කළ ස්ථානය තිබෙන්නේ ඇය දැන් සිටින ස්ථානයේ සිට කුමන දිශාවෙන් ද?

......................................................

- අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

(30) සූර්ය නමස්කාරයේ අවස්ථා ගණන වනුයේ,
(i) 13 (ii) 11 (iii) 12

(31) ජාතික කොඩියේ රතු පැහැති පසුබිමෙන් නිරූපණය වන්නේ,
(i) ජාතික අභිමානය (ii) සතර බ්‍රහ්ම විහරණ (iii) සිංහල ජාතිය

(32) බිත්තරයකින් උපත ලබන සත්ත්වයෙකි,

(i) ලේනා (ii) හාවා (iii) හූනා

(33) ස්වභාවික අනතුරක් නොවන්නේ,

(i) නාය යාම (ii) ගංවතුර (iii) දියේ ගිලීම

(34) ශ්‍රී ලංකාවේ මුහුදට මායිම් නොවන පළාතකි,

(i) වයඹ (ii) නැගෙනහිර (iii) ඌව

(35) පුරාණ ශ්‍රී ලංකාව ප්‍රධාන කොටස් කීයකට බෙදා තිබුණි ද?

(i) එකකි (ii) හතරකි (iii) තුනකි

(36) සාමයේ සංකේතය පිළිබිඹු වන්නේ කුමන පක්ෂියා මගින් ද?

(i) මයිනා (ii) වලිකුකුළා (iii) සුදු පරවියා

(37) සුදු පැහැති රුධිරය ඇති සත්ත්වයා,

(i) හූනා (ii) කැරපොත්තා (iii) බත්කූරා

(38) ශ්‍රී ලංකාවේ පළාත් ගණන දැක්වෙන පිළිතුර වනුයේ,

(i) 25 කි (ii) 4 කි (iii) 9 කි

(39) අපට ජලය ලැබෙන ස්වභාවික ක්‍රමයක් නොවන්නේ,


(i) වර්ෂාව (ii) ගංගා (iii) ජල කරාම

(40) තවාන් කර පැළ ලබා ගන්නේ මින් කුමක් ද?

(i) මෑ (ii) බණ්ඩක්කා (iii) වම්බටු

(41) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය දැක්වෙන්නේ මින් කුමන නෝට්ටුවේ ද?

(i) රු.20 (ii) රු.100 (iii) රු.50

(42) 

මෙම තරු රටාවෙන් දැක්වෙන්නේ කුමක් ද?

(i) ගෝනුස්සා (ii) මහ බල්ලා (iii) මහ වලසා

(43) සුළඟ මගින් ව්‍යාප්තවන බීජයක් වන්නේ,

(i) දඹල ඇට (ii) වරා (iii) පුවක්

(44) ඉන්දියන් සාගරය ශ්‍රී ලංකාවට කුමන දෙසින් පිහිටා ඇත් ද?

(i) උතුරු දිශාවෙන් (ii) දකුණු දිශාවෙන් (iii) නැගෙනහිර දිශාවෙන්

(45) වී වගාවේ දී වැසි ලැබෙන ආකාර අනුව වගාව ප්‍රධාන කන්න දෙක කුමක් ද?

(i) යල/නිරිත දිග (ii) යල/මහ (iii) ඊසාන දිග/නිරිත දිග

(46) ශ්‍රී ලංකාවේ උසම කන්ද වනුයේ,

(i) සමනල කන්ද (ii) නමුණුකුල (iii) පිදුරුතලාගල


(47) ආලෝක සංඥා කුළුණෙහි කහ පැහැති වර්ණ සංඥාවෙන් කියවෙන්නේ,
(i) වාහනය නතර කරන්න.
(ii) රථය ගමනට සූදානම් කරන්න.
(iii) ගමන ආරම්භ කරන්න.

(48) වගාවන්ට අහිතකර සතෙකු වන්නේ,
(i) මී මැස්සා (ii) ගැඩවිලා (iii) දළඹුවා

(49) කප්පාදු කළ යුතු ශාක වර්ගයක් වන්නේ,
(i) තේ (ii) පොල් (iii) රබර්

(50) රෝගවලින් ආරක්ෂා වීමට ඔබ කළ යුතු දේ සඳහන් නොවන්නේ මින් කවරක ද?
(i) පලතුරු හොඳින් සෝදා ආහාරයට ගැනීම.
(ii) කැස්ස, කිවිසුම් එනවිට අතින් පිසදා ගැනීම.
(iii) නිතර සබන් යොදා අත් සේදීම.

(51) සන්නිවේදනයේ මූලික අංග 3 නිවැරදි ව දැක්වෙන්නේ,
(i) යවන්නා, මාධ්‍ය, ලබන්නා
(ii) මාධ්‍ය, ලබන්නා, යවන්නා
(iii) ලබන්නා, මාධ්‍ය, යවන්නා

(52) 

රූපයේ දැක්වෙන්නේ විද්‍යුත් චුම්බකයකි. මෙහි චුම්බක බලය වැඩි කිරීමට,
(i) වියළි කෝෂ ගණන වැඩි කළ යුතු ය .
(ii) වියළි කෝෂ ගණන අඩු කළ යුතු ය.
(iii) කොයිල් කම්බියේ දිග අඩු කළ යුතු ය.

(53) දූෂිත ජලය පරිහරණය කිරීමෙන් වැළඳෙන රෝගයක් නොවන්නේ,
(i) පාචනය (ii) චිකුන් ගුන්යා (iii) හෙපටයිටීස්

(54) සල් මලක ඇති පෙති ගණන වන්නේ,
(i) 6 (ii) 4 (iii) 5

(55) මලක ආවරණ පත්‍ර යනුවෙන් හැඳින්වෙන්නේ,
(i) නටුව (ii) මණිපත්‍ර (iii) පෙති

(56) වැලි යට දමා කල් තබා ගන්නා එළ වර්ගයකි,
(i) දෙහි (ii) රඹුටන් (iii) කොස් ඇට

(57) මෙහි විශාලත්වය වැඩිවන අයුරින් දැක්වෙන පිළිතුර වන්නේ,
(i) ලෝකය, රට, පළාත, දිස්ත්‍රික්කය
(ii) පළාත, දිස්ත්‍රික්කය, රට, ලෝකය
(iii) දිස්ත්‍රික්කය, පළාත, රට, ලෝකය

(58) ශ්‍රී ලංකාවේ ජන ක්‍රීඩා පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,
(i) ඔළිඳ කෙළිය, එළුවන් කැම, එල්ලේ
(ii) ගුඩු පැනීම, අත්පන්දු, පොරපොල් ගැසීම
(iii) එළුවන් කැම, පංච දැමීම, ඔළිඳ කෙළිය

(59) ජලය ස්වල්පයකට හොඳින් ලුණු දියකර හිරු එළියේ තැබූ විට සිදුවන්නේ,

(i) ලුණු ඉතුරු වී ජලය සියල්ල වාෂ්ප වීමයි.

(ii) ජලයේ ලුණු රස ක්‍රමයෙන් අඩු වීමයි.

(iii) ජලය සමඟ ලුණු ද වාෂ්ප වී නොපෙනී යාමයි.

(60) නොකඩවා ඇදහැළුණු වර්ෂාව හේතුවෙන් ගංවතුර ගලා මිනිසුන් සහ සතුන් අවතැන් ව සිටින බව නිතර ම පුවත්පත්, ගුවන් විදුලිය හා රූපවාහිනියෙන් අසන්නට දකින්නට ලැබේ. එම ආපදා තත්වය නිසා පාසල් යන වයසේ දරුවන්ගේ පොත් පත් ආදිය ද ගංවතුරට හසු වී විනාශ වී ඇති බව ඔබට දැනගන්නට ලැබුණේ නම්, පාසල් යන දරුවෙක් ලෙස එම අවස්ථාවේ ඔබට කළ හැකි දේවල් පිළිබඳ නිර්මාණාත්මක වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යක ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත නිවැරදි ලෙස ගැළපිය යුතු ය.)

(i) ..........................................................................................................................................

..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

..........................................................................................................................................

(iii) ..........................................................................................................................................

..........................................................................................................................................

නිවැරදි හා පැහැදිලි අත් අකුරු සඳහා ලකුණක් ප්‍රදානය කරන්න.

මාතෘකාවට අදාළ ව කරුණු සහිත ව ලියා තිබේනම් ලකුණු ලබා දෙන්න.